2007 නොවැම්බර්
52 වසර 03 කලාපය
ISSN 1391- 3034

නවයුගය

52nd Year 03rd Issue
2007 November

NAVAYUGAYA SINHALA MONTHLY MAGAZINE

# ඡායාරූපකරණය

ශ්‍රීට දශක හතරකට පහකට පෙර කැමරාව ලොකු කුඩා කාටත් මවිතයක් ගෙන දුන් විජ්ජාකාරී පෙට්ටියක් විය. එහෙත් තාක්ෂණය දියුණු වෙත්ම කැමරාව හැම දෙනාගේම පාහේ අත ගැවසෙන භාණ්ඩයක් බවට පත් විය.

අද වන විට කැමරාව ජංගම දුරකථනයටත් අයත් අංගයක් බවට පත් වී අවසානය. එය තව දුරටත් විජ්ජාකාරී භාණ්ඩයක් නොවේ. කැමරාව අද බහුල භාණ්ඩයක් බවට පත් වුව ද කැමරාකරණය ශිල්පීය නිපුණත්වයක් ඇති, කලාත්මක ඇසක් ඇති, විශේෂඥ ක්‍රියාවකි. මේ නිසා ම වෘත්තීය කැමරා ශිල්පීහු නමැති පිරිසක් අද රට තුළ සිටිති.



මේ වෘත්තීය කැමරා ශිල්පීන් අතර ද විවිධ අංශවලට යොමු වූ, ඒ අංශ කෙරෙහි ප්‍රවීනත්වයක් සහ නිපුණත්වයක් ඇති අය සිටිති. උදාහරණයක් හැටියට ජනමාධ්‍ය කැමරා ශිල්පීන් ගනිමු. ඒ අය අතර නම ගිය දක්ෂ ප්‍රවෘත්ති ඡායාරූප ශිල්පියෝ වෙති. මෝස්තර නිරූපණ ශිල්පී ඡායාරූප ගැනීම කෙරෙහි ප්‍රසිද්ධියක් උසුලන්නෝ වෙති.

මේ ආකාරයට ම වෙළෙඳ ඡායාරූප ශිල්පීහු, උත්සව ප්‍රිය සම්භාෂණ, ඡායාරූප ශිල්පීහු, කලාත්මක ඡායාරූප කෙරෙහි විශේෂඥතාවක් ඇති ඡායාරූප ශිල්පීහු, වනජීවී ඡායාරූප ශිල්පීහු, ශිල්පීය ප්‍රයෝග පිළිබඳ නිපුණත්වයක් ඇති ඡායාරූප ශිල්පීහු වෙති.

මේ අංශවල දක්ෂතා දක්වන ප්‍රවීනත්වයක් දක්වන ඡායාරූප ශිල්පීන් සිටිය ද ඒ අතලොස්සකි. වර්තමාන ලෝකයේ පුළුල් වාණිජ කටයුතුවලට අවශ්‍ය තරම් වාණිජ ඡායාරූප ශිල්පීන් නැත. ශිල්පීය ප්‍රයෝග පිළිබඳ නිපුණතාවක් ඇති අය හිඟ ය.

ඊට හේතු වී ඇත්තේ අපේ තරුණ පරපුර මේ අංශ කෙරෙහි ගැඹුරු අවධානයක් නොදැක්වීමය. ඒ ඒ අංශ කෙරෙහි ශිල්පීය අධ්‍යාපනයක් ලබා නොගැනීම ය.

අනෙක් අතට ඡායාරූපකරණය පිළිබඳ උගන්වන ආයතන සහ පාඨමාලා රට පුරා ඇතත් නිසි පරිදි සැකසුණු ඡායාරූප පාඨමාලා ඇත්තේ එකක් දෙකක් පමණි.

කලකට ඉහත දී හේවුඩ් ආයතනයේ ඡායරූප පාඨමාලාවක් පවත්වා ගෙන යනු ලැබිණි.

සරසවියක දෙකක ඡායාරූප උපාධි පාඨමාලා අද ඇතත් ඒ සම්බන්ධව සිසු සිසුවියන්ගේ අවධානය යොමු වන්නේ ඉතා කලාතුරකිනි. අනෙක් අතට සරසවිවල ඇති ඡායාරූපකරණ උපාධි පාඨමාලාවල මට්ටම ද ඒ තරම් ඉහළ තත්ත්වයක පවතින බවක් පෙනෙන්නට නැත. එහෙත් ඡායාරූපකරණය වත්මන් වෙළෙඳ සමාජයේ හොඳ ආදායම් ලැබිය හැකි අංශයකි. අවශ්‍ය වන්නේ නිසියාකාර අධ්‍යාපනයක්, ශිල්පීය ඥානයක්, නවීන තාක්ෂණය පිළිබඳ දැනුමක් ඇති ඡායාරූප ශිල්පීන් ය.




මෙවර නවයුගය කවරයේ කතාවට ඡායාරූපකරණය තේමා කර ගත්තේ අපේ අනාගත පරපුර තුළ ඒ උනන්දුව ඇති කිරීම සඳහා කිසියම් උත්තේජනයක් ලබා දීමේ අරමුණ ඇතිව ය.